# නර්තනය

## 10 වන ශ්‍රේණිය

විස්තරාත්මක විෂය නිර්දේශය

(2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම.

<u>පටුන</u>

පිටුව

| | |
|---|---|
| පොදු නිපුණතා | 1 |
| ශ්‍රේණියට අදාළ නිපුණතා | 2 |
| හැඳින්වීම | 3 -4 |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද | 5 - 6 |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 7 |
| තක්සේරුකරණය හා ඇගයීම | 8 |
| විෂය නිර්දේශය | 9 -13 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

<u>පොදු නිපුණතා</u>

1. නර්තනය හා බැදි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.
2. පරිසරය නිරීක්ෂණය කිරීමෙන් ලබන අත්දැකීම් ඇසුරුකොට නර්තන හා වාදන කලාකෘති නිර්මාණය කරයි.
3. නර්තනය හා බැදි ඓතිහාසික සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
4. නර්තන කලා කෘතීන්ගේ සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳව විචාරාත්මකව කරුණු දක්වයි.
5. විවිධ කලා මාධ්‍යයන් නර්තනයේ දී අවස්ථාවෝචිත ව භාවිතයට ගනියි.
6. ප්‍රාසංගික කලා නිර්මාණ ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# 10 ශ්‍රේණියට අදාළ නිපුණතා

1. සාම්ප්‍රදායික හා නිර්මාණාත්මක නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

2. නර්තනය හා බැඳි සමාජ සංස්කෘතික හා ඓතිහාසික පසුබිම අධ්‍යයනය කරයි.

3. සාම්ප්‍රදායික ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

4. සාම්ප්‍රදායික හා නිර්මාණාත්මක වාදන අංග ඉදිරිපත් කරයි.

5. නර්තනය හා බැඳි කලාත්මක අංග විචාරයට ලක් කරයි.

6. වෙනත් සංස්කෘතීන්ට අයත් නර්තන අගය කරයි.

7. නර්තනය හා අනෙකුත් සෞන්දර්ය විෂය හා බැඳි සම්බන්ධතා අධ්‍යයනය කරයි.

8. ජනමාධ්‍ය තුළින් දැක්වෙන නර්තනය හා බැඳි කලාකෘති විචාරයට ලක්කරයි.

9. ජීවිතයේ අවශ්‍ය තැන්හිදී කලා නිර්මාණ ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

<u>10 ශ්‍රේණිය විෂය නිර්දේශය - නර්තනය</u>

<u>හැඳින්වීම</u>

2006/2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව විෂයමාලා නවීකරණය කිරීම හා අධ්‍යාපන සංකල්ප යාවත්කාලීන කිරීම කාලීන අවශ්‍යතාවයක් බව පිළිගෙන ඇත. 2007 වසරේ සිට ක්‍රියාත්මකවන 10 ශ්‍රේණිය විෂය නිර්දේශය නිපුණතා පාදකව සකස් වී ඇති අතර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමට සරිලන අයුරින් දැනුම, ආකල්ප, කුසලතා හා ජීවිතයට අදාළ කර ගැනීමට හැකි වන පරිදි සම්පාදනය වී ඇත.

විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයා වඩාත් ක්‍රියාකාරී ලෙස සහභාගි කරවා ගැනීම ගුරුවරයා සතු කාර්යභාරයකි. ඒ සඳහා යෝග්‍ය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගත යුතු වේ.

මෙම විෂය නිර්දේශයේ අපේක්ෂණය වන්නේ ශිෂ්‍යයාට නිදහසේ සතුටින් නර්තන කුසලතා ප්‍රදර්ශනයටත්, ගවේෂණයටත්, සන්නිවේදන කුසලතා දැක්වීමටත් තම ජීවිත ගැටළු නිරාකරණය කර ගනිමින් නව සහශ්‍රයට සරිලන පරිදි චින්තන කුසලතා වර්ධනය කර ගැනීමත්ය. ඒ සඳහා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදී ගුරු - ශිෂ්‍ය කාර්යභාරය පිළිබඳ මනා අවබෝධයකින් යුතු ව පහත සඳහන් අංග කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගත යුතු වේ.

- නර්තනය හා බැඳි ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා සිද්ධාන්ත.
- නර්තනය හා බැඳි සංස්කෘතික හා ඓතිහාසික පසුබිම
- නිර්මාණ ඉදිරිපත් කිරීමේ කුසලතාව.
- රසාස්වාදය.
- සෞන්දර්ය විෂය හා බැඳි වටිනාකම්

ඉහත ක්ෂේත්‍ර කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමින් ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට අවශ්‍ය නර්තන ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම ඔබගේ වගකීම හා කාර්යභාරය වනු ඇත.

විෂය නිර්දේශයේ සැකැස්ම දල වශයෙන් කොටස් කීපයකට බෙදා දක්වා ඇත.

- නිපුණතාවය
- නිපුණතා මට්ටම
- විෂය අන්තර්ගතය හා කාලය
- ගුණාත්මක යෙදුම් භාවිතය

- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම උපායන්
- පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය
- තක්සේරුකරණය හා ඇගයීම වශයෙනි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මඟපෙන්වීම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇත. එහි අන්තර්ගතය නිපුණතා 6 ක් හා නිපුණතා මට්ටම් 26 ක් අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයෙකු වශයෙන් ඔබගේ වෘත්තීය සාඩම්බර අයුරින් ආත්ම විශ්වාසයෙන් යුතු ව ධෛර්ය සම්පන්න ව ඉටු කරන්නේ නම් යහපත් සෞන්දර්ය රසඥතාවයෙන් යුත් ශිෂ්‍ය පරපුරක් බිහිකිරීමේ ගෞරවය ඔබට හිමිවනු ඇතැයි විශ්වාස කරමු.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

<u>ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය</u>

6 වන ශ්‍රේණියේ සිට නර්තන විෂය හැදෑරූ ශිෂ්‍යයා 10 වන ශ්‍රේණිය වන විට එම වසරේදී අපේක්ෂිත සාධන මට්ටම කරා යොමුකළ යුතු වේ. ඒ සඳහා සුවිශේෂ වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම විෂය භාර ගුරුවරයාගේ කාර්ය භාරය වේ.

1997 වසරේ සිට ක්‍රියාත්මක මෙම නව විෂය නිර්දේශය නිපුණතා පාදක සංකල්පය මත ගොඩනැගී ඇති බැවින් ඊට සරිලන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලින්ද සැලසුම් කරගත යුතු ය. ඒ අනුව ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලින් භාවිතා කිරීම වඩාත් ඵලදායි වනු ඇත. විශේෂයෙන් නර්තනය ප්‍රායෝගික විෂයක් වන හෙයින් එම විෂය හදාරණ සිසුන් මාර්ග දෙකක් ඔස්සේ අධ්‍යයනයට යොමු කළ යුතු වේ. ඉන් එක් මඟක් වනුයේ ප්‍රායෝගික කුශලතා පිළිබඳ නිපුණතාවය කරා සිසුන් ළඟාකරවීමය. අනෙක ඒ හා සම්බන්ධ සිද්ධාන්තමය හා සංස්කෘතික පසුබිම පිළිබඳව දැනුම හා ආකල්ප වර්ධනය කරලීම සඳහා මඟසලසා දීමය.

ඒ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලින් අනුගමනය කිරීමේදී පළමු පියවරක් වශයෙන් සිසුන්ගේ අවධානය දිනා ගැනීම අත්‍යවශ්‍ය වේ. මීට අමතර වශයෙන් පෙර දැනුම සිහිපත් කිරීමටත් ඉදිරි කටයුතු පිළිබඳ අවදියක් ඇතිකිරීමටත් පියවර ගත යුතු ය.

විෂයයට අදාළ තොරතුරු අධ්‍යයනයේදී සිසුන් නිරීක්ෂණයට හා ගවේශණයට යොමුකරවීම වැදගත් වේ. මෙම කාර්යයේදී සිසුන් තනිව හා කණ්ඩායම් වශයෙන් යෙදවීම ද ප්‍රයෝජනවත් වේ. මක්නිසා ද යත් සමාජ සම්බන්ධතා හා හැකියා සිසුන් තුල වර්ධනය කරලීමට එමඟින් හැකියාව ලැබෙන බැවිනි.

නිරීක්ෂණ හා ගවේෂණ ඇසුරින් සිසුන් අනාවරණය කරගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම ප්‍රයෝජනවත් වනු ඇත. අදහස් ඉදිරිපත් කිරීමේදී පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට ද දෙවනුව සවන් දුන් කණ්ඩායම් ද තෙවනුව ගුරුවරුන් ද එම තොරතුරු ඇසුරින් සාකච්ඡා මෙහෙයවීම වැදගත් වේ.

මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ක්‍රම ශිල්ප රාශියක් භාවිත කළ හැකි වේ. මෙහිදී ප්‍රවේශයක් වශයෙන්

බුද්ධි කලම්බන

සංවාද

පින්තූර ඇසුරින් කරුණු සකච්ඡා කිරීම

කණ්ඩායම් සාකච්ඡා

නිර්මාණ ක්‍රියාකාරකම්

ආදර්ශන (නර්තන, ගායන, වාදන)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්ෂේත්‍ර අධ්‍යයන

ප්‍රදර්ශන, ආදිය භාවිත කළ හැකි ය.

ප්‍රායෝගික කුශලතා වර්ධනය අරමුණින් කෙරෙන ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලියේදී නර්තනය සඳහා සුවිශේෂ වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප භාවිතා කළ හැකිය.

අනුකරණ ක්‍රමය

අභ්‍යාස ක්‍රමය

පියවර ක්‍රමය

කණ්ඩායම් ක්‍රමය

කැඩපත් ක්‍රමය

සිද්ධි රංගන

රංග ක්‍රීඩා

භූමිකා රංගන, වැනි ක්‍රම ශිල්ප යොදා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත. මීට අමතරව ගුරුවරයාම සුදුසුයයි සිතන වෙනත් ක්‍රම ශිල්ප භාවිත කළ හැකිය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

<u>පාසල් ප්‍රතිපත්ති හා පාසල් වැඩසටහන්</u>

නර්තන විෂය නිර්දේශය පාසල තුළ ක්‍රියාත්මක වීමේදී නිපුණතා පාදක ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන අවස්ථා උදාකරදීමට සැලසුම් කොට ඇත. එහිදී නිර්දේශිත විෂයමාලාවට අමතරව පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබන විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යාගේ සහභාගිත්වය, අපේක්ෂිත නර්තන විෂය නිපුණතා සාක්ෂාත් කරගැනීමට මහත් පිටුවහලක් වනු ඇත. මෙහිදී , ප්‍රදර්ශන, සංදර්ශන, ව්‍යාපෘති , කලා සංගම්, පුස්තකාල පරිහරණය වැනි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම අවධාරණය කෙරේ.

නර්තන නිර්මාණකරණයේදී පරිසර නිරීක්ෂණය අත්‍යවශ්‍ය සාධකයක් වේ. පරිසරයේ විවිධ සංසිද්ධීන් කෙරෙහි ශිෂ්‍යයා සංවේදී පුද්ගයකු කිරීමට නිරීක්ෂණ චාරිකා, කලා නිර්මාණ හා කලා මධ්‍යස්ථාන අධ්‍යන චාරිකා සංවිධානය කිරීම ඉතා වැදගත් වේ. මීට අමතරව බිත්ති පුවත්පත් , වාර සඟරා, තරග වැනි ක්‍රියාකාරකම් සිසුන්ගේ නිර්මාණාත්මක ශක්ති වර්ධනය කෙරෙහි බලපාන සැඟවුන විෂයමාලාවට අයත් අංග ලෙස සැළකිය හැකිය.

මිනිස් චර්යා හැඩගැස්වීම කෙරෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් කරනු ලබන බලපෑම අතිවිශාල වේ. රසඥතා වර්ධනය සහ විචාර ශක්ති වර්ධනය සඳහා මාධ්‍ය වැඩසටහන් අධ්‍යයනය කිරීම වැදගත් වන අතර, ඒ සඳහා ශිෂ්‍යයනට අවශ්‍ය පහසුකම් සලසාදීම පිළිබඳ ව පාසල් බලධාරීන්ගේ අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත.

උක්ත ක්‍රියාකාරකම් හා නර්තන විෂය සන්ධාරය අතර ඇති සහසම්බන්ධතාව, නර්තන විෂය හැදෑරීමේදී ශිෂ්‍යයාට පාසල් පරිසරය ප්‍රිය ජනක ඉගෙනුම් අත්දැකීම් ඇති ස්ථානයක් බවට පත්කිරීමට සමත්වනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## <u>තක්සේරුව හා ඇගයීම</u>

නිපුණතා පාදක ඇගයීම් ඉදිරියට ගෙනයාමට නැතහොත් සිසුන් තුළ නිපුණතා සංවර්ධනය කිරීමට ක්‍රමානුකූල ව සැලසුම් කළ වැඩ පිළිවෙලක් අවශ්‍ය වනු ඇත. එහිදී ඇගයීමට ලැබෙනුයේ අද්විතීය ස්ථානයකි. පන්තිකාමර අධ්‍යාපන ක්‍රියාවලියේදී ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම එකම කාර්යයක් සේ සළකනු ලබයි.

ඇගයීම් වර්ග අතුරින් සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම යනුවෙනුත් පාසල් ව්‍යවහාරයේ සුලබ අංග දෙකක් වේ. මෙම දෙවර්ගය භාවිතයට ගන්නා ආකාරය කෙටියෙන් විමසා බැලීම වැදගත් වනු ඇත.

සම්භවන ඇගයීම යනු සිසුන්ගේ ඉගෙනුම් සාඵල්‍යයේ පවතින විවිධ ප්‍රාප්ති මට්ටම් හඳුනාගෙන ශිෂ්‍ය සාධනය ඉහල නැංවීම සඳහා අඛණ්ඩව කෙරෙන තක්සේරු ක්‍රියාවලියයි. මෙම තක්සේරුව සිසුන් ඉගෙනීමෙහි යෙදී සිටින අවස්ථාවේ ගුරුවරයා ඔවුන්ගේ හැකියා මෙන්ම නොහැකියා ගැන නිතර සොයාබලා ඉගෙනුම් කාර්යයට උදව් කරමින් අපේක්ෂිත ප්‍රවීණතා මට්ටමට රැගෙන ඒම වේ.

සම්පිණ්ඩන ඇගයීම යනු කාලපරාසයක් තුළ දී එනම් වාරයක් හෝ වර්ෂයක් ආසන්නයේ කෙරෙන ශිෂ්‍යයාගේ ශාස්ත්‍රීය සාධනය විභාග කිරීම හෙවත් ගුණාත්මක ව පරීක්ෂා කිරීමට ඉවහල්වන අතර, සාධනය පිළිබඳ වඩාත් සුවිශේෂීකරණයක් සඳහා අවශ්‍ය කරනුයේ නිර්ණායක මූලික ව සිදුවන තක්සේරුකරණයයි.

මෙය ප්‍රතිපෝෂණ ක්‍රියාවලියට හා අනාවරණය සඳහා වැදගත්වන අවස්ථා මෙන්ම ප්‍රතිකාර්ය ඉගැන්වීමට සුදුසු අවස්ථා හඳුනාගැනීමේ දී වඩාත් ප්‍රායෝගික වටිනාකමකින් යුක්ත වන්නේය.

නර්තන විෂය හුදෙක් ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලින් යුක්ත විෂයක් වන හෙයින් ඉහත කී ඇගයීම් ක්‍රමවේද දෙවර්ගය ම යොදාගැනීම වැදගත් වනු ඇත.

තක්සේරුකරණයට අමතර ව වර්ෂය තුළ දී නිශ්චිතව ම සිදු කළ යුතු ඇගයීම් වාර අවස්ථා හයක් අපේක්ෂා කෙරේ. තෝරාගත් අවස්ථා (ලක්ෂ) හයේදී මෙම ඇගයීම් ක්‍රියාත්මක වීම ශිෂ්‍ය සාධනය මැන බැලීමෙහිලා ඉතා ඵලදායි වේ. ඒ සඳහා ගැළපෙන ඇගයීම් උපකරණ කල්තබා සකස් කර ගැනීම ද වැදගත් වේ.

මෙම ඇගයීම් ක්‍රියාවලියේදී ශිෂ්‍යයගේ ප්‍රවීණතා මට්ටම පිළිබඳ විශේෂයෙන් සළකා බැලීම කෙරෙන අතර ප්‍රවීණතාව තහවුරු කිරීමට අවම වශයෙන් ලකුණු 60 ක්වත් ලබාගත යුතු වේ. ලකුණු 60 - 80 තෙක් සීමාව ආසන්න ප්‍රවීණතා මට්ටම ලෙසත්, ලකුණු 60 ට අඩු සීමාව ප්‍රවීණතාව ලබා නොමැති සීමාව ලෙසත් සළකනු ඇත.
මෙකී කරුණු පහත සඳහන් ලෙස වගු ගත කළ හැකි ය.
ඒ අනුව ලකුණු 0 - 60 - ප්‍රවීණතාව ලබා නොමැත.
ලකුණු 61 - 80 ආසන්න ප්‍රවීණතාවට ළඟාවී ඇත.
ලකුණු 81 - 100 ප්‍රවීණතාව ලබා ඇත. ආදී වශයෙන් සැළකිය යුතු වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# 10 ශ්‍රේණිය

## නර්තනය - විෂය නිර්දේශය

| නිපුණතාව/නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 1.නිපුණතාව:<br>නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.<br><br>නිපුණතා මට්ටම<br>1.1 නිවැරදි අංගහාර පවත්වා ගනිමින් නර්තනාංග අභ්‍යාස කරයි. | උඩරට කස්තිරම සමඟ - ගොඩ සරඹ<br>10 සිට 12 දක්වා<br>පහතරට ඉරට්ටිය සමඟ - ඉලංගම් සරඹ<br>10 සිට 12 දක්වා<br>සබරගමු කලාසම සමඟ - පිට මාත්‍රා පද -<br>ජීමිත කුදාදොං මාත්‍රයේ අලංකාර පද හතරක් | 05 |
| 1.2 නර්තන ක්‍රියාවලිය හා සිරුර අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරයි. | ශරීරාවබෝධය සහසම්බන්ධතා | 02 |
| 1.3 ගැමි ගායනා ඉදිරිපත් කරයි. | රබන් කවි<br>මෝල්ගස් කවි | 02 |
| 1.4 සාම්ප්‍රදායික ගායනා ඉදිරිපත් කරයි | නමස්කාර ගාථා<br>මල්යහන් කවි<br>සිරස පාද කවි<br>සිංහරාජ වන්නම/ හනුමන්තා තාලය /විරාඩි වන්නම | 06 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | | |
|---|---|---|
| 1.5 ගායනය සහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි. | උඩරට කස්තිරම,සීරුමාරුව , අඩව්ව සමඟ -සිංහරාජ වන්නම<br>පහතරට ඉරට්ටිය සමඟ - හනුමන්තා තාලය සින්දු වන්නම<br>සබරගමු කලාසම , අඩව්ව සමඟ-විරාඩි වන්නම | 04 |
| 1.6 තාල ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | 2+2+4 තුන්තිත<br>ඉගෙනගත් තාලවලට අයත් බෙරපද , කවි පද, කස්තිරම්/ඉරට්ටි/කලාසම් /අඩව් ප්‍රස්තාරකරණය. | 04 |
| 1.7 ගායනය රහිත සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශණය කරයි. | උඩරට - කුදාංත ගත දොං වට්ටම (පළමු පදය, කස්තිරම, අඩව්ව)<br>පහතරට - ගුද ගතිගත වට්ටම (පළමු පදය, අන්තාඩිය, ඉරට්ටිය)<br>සබරගමු - ගමන් මාත්‍රයේ අලංකාර පද එකක් (කලාසමක් හා අඩව්වක්) | 03 |
| 1.8 ගැමි නාටක හා බැඳි ගායනා ඉදිරිපත් කරයි. | සොකරි කවි, කෝළම් කවි | 02 |
| 1.9 වාදනයේ මූලික හැකියා ප්‍රදර්ශණය කරයි. | මාත්‍රා 2,3,4,තනිතිතේ සහ මාත්‍රා 3 + 4 දෙතිතේ තාලවලට අයත් බෙර පද | 04 |
| 1.10 දේශීය වාද්‍ය භාණ්ඩයන්හි ව්‍යුහය හා සැකැස්ම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි. | උඩරට බෙරය<br>පහතරට බෙරය<br>දවුල | 04 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | | |
|---|---|---|
| 2. නිපුණතාව<br>නර්තන හා වාදන කලාකෘති නිර්මාණය කරයි.<br><br>නිපුණතා මට්ටම<br>2.1 ගැමි නැටුම් නිර්මාණ කරයි | රබන් නැටුම | 04 |
| 2.2 විවිධ චරිත සඳහා නර්තන නිර්මාණ කරයි. | චරිත කිහිපයක් ඇති සින්ධියක් | 05 |
| 2.3 ගීත අනුව නර්තන නිර්මාණ කරයි. | තාලානුකූල චලන<br>රිද්මයානුකූල චලන<br>ප්‍රකාශනාත්මක චලන | 09 |
| 2.4 සමූහ වාදන නිර්මාණ කරයි. | සම්ප්‍රදායික හා ආදේශ භාණ්ඩ ඇසුරින් | 05 |
| 3. නිපුණතාව<br>නර්තන හා බැඳි ඓතිහාසික, සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>නිපුණතා මට්ටම<br>3.1 ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි. | ගම්පල යුගය<br>කෝට්ටේ යුගය | 03 |
| 3.2 දේශීය නර්තන සම්ප්‍රදායන්ගේ සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරයි. | ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මයක<br>ප්‍රචලිත ප්‍රදේශ<br>ඇදහිලි, විශ්වාස, චාරිත්‍ර විධි | 05 |
| 3.3 ශ්‍රී ලංකාවේ ගැමි නාටක පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | සොකරි නාටකය<br>කෝලම් නාටකය | 05 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | | |
|---|---|---|
| 3.4 නර්තනය හා බැඳි සංස්කෘතිකමය හරයන් අගය කරයි. | නර්තනය හා බැඳි සාරධර්ම | 02 |
| 3.5 නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගය කරයි | ජේ.ඊ.සේදරමන්<br>නිත්තවෙල ගුණයා<br>සවිරිස් සිල්වා<br>එන්.ඒ.සිරිබෝහාමි<br>එම්.එච්.ගෝමිස් | 03 |
| 3.6.වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | භරත නාට්‍ය සම්ප්‍රදාය<br>කථක් නර්තන සම්ප්‍රදාය | 04 |
| 4. නිපුණතාව<br>නර්තන කලාකෘතීන්හි සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක්කරයි.<br><br>නිපුණතා මට්ටම<br>4.1 පරිසරයේ දක්නට ලැබෙන නර්තන කලාකෘති අගය කරයි. | • සාම්ප්‍රදායික නර්තන , ගායන, වාදන<br>• නිර්මාණාත්මක නර්තන | 02 |
| 4.2 ජනමාධ්‍ය තුළින් දක්නට ලැබෙන නර්තන අංග විචාරයට ලක් කරයි. | • සාම්ප්‍රදායික නර්තන<br>• අද්‍යතන නර්තන | 02 |
| 4.3 නර්තනය හා බැඳි ගායනයන්හි සෞන්දර්යාත්මක වටිනාකම් අගය කරයි | • ගැමි ගායනා<br>• ශාන්තිකර්ම ගායනා<br>• ගැමි නාටක හා බැඳි ගායනා<br>• තෝරාගත් ගීත ගායනා<br>• වන්නම් | 04 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | | |
|---|---|---|
| 5.නිපුණතාව<br>විවිධ කලා මාධ්‍යයන් නර්තනයේදී අවස්ථාවෝචිතව භාවිතයට ගනියි.<br><br>නිපුණතා මට්ටම<br><br>5.1 නර්තනය හා නාට්‍ය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ අදහස් දක්වයි. | • නර්තන හා නාට්‍ය අතර ඇති සම්බන්ධය | 02 |
| 5.2 දේශීය මුද්‍රා නාට්‍ය සංකල්පය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි. | • පසුබිම හා විකාශය | 02 |
| 6. නිපුණතාව<br>ප්‍රාසංගික කලා නිර්මාණ ප්‍රදර්ශණය කරයි<br><br>නිපුණතා මට්ටම<br><br>6.1 නර්තන/ගායන /වාදන/සැරසිලි කලා නිර්මාණ ඉදිරිපත් කරයි. | • ඉගෙන ගන්නා ලද නර්තන /ගායන/වාදන හා සැරසිලි ඇසුරින් | 07 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved